රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව
அரச கணக்குகள் திணைக்களம்
Department of State Accounts

**SA/AS/AA/Circular** 2013.07.12

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ
දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත.

මහත්මයාණෙනි/මහත්මියනි,

**<u>උපචිත පදනම යටතේ ගිණුම් තැබීමේදී ස්ථාවර හා ජංගම වත්කම් වාර්තා කිරීම සඳහා කේත අංක හඳුන්වාදීම.</u>**

උපචිත පදනම යටතේ ස්ථාවර හා ජංගම වත්කම් ගිණුම්ගත කිරීම සම්බන්ධයෙන් 2013.06.24 දින නිකුත් කළ GFS/02 ලිපියට අමතර වශයෙනි.

2. ඒ අනුව උපචිත පදනම යටතේ පළමුවෙන්ම නියාමන වැඩසටහනක් වශයෙන් ගිණුම් පිළියෙල කිරීම 2013 වර්ෂයේ සිට ආරම්භ කිරීමට සැලසුම්කර ඇති බැවින් එක් එක් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවේ ස්ථාවර වත්කම් එනම් වාහන (2101), ගෘහභාණ්ඩ හා කාර්යාලීය උපකරණ (2102), යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ (2103), ගොඩනැගිලි හා ඉදිකිරීම් (2104) සහ ඉඩම් සහ ඉඩම් වැඩිදියුණුකිරීම් (2105) හි අගය පොත්වලට ඇතුලත් කිරීමට පියවර ගත යුතුය. ඒ සඳහා තක්සේරු දෙපාර්තමේන්තුව විසින් ගොඩනැගිලි හා ඉදිකිරීම් (2104) සහ ඉඩම් සහ ඉඩම් වැඩිදියුණුකිරීම් (2105) වටිනාකම තක්සේරු කිරීම දැනටමත් ආරම්භකර ඇති අතර මේ දක්වා ඔබ ආයතනය අදාල ගොඩනැගිලි සහ ඉඩම් තක්සේරු කිරීමේ කාර්යය නිමකර නොමැති නම් මෙම වර්ෂය ඇතුලත එම කාර්යය තක්සේරු දෙපාර්තමේන්තුව හා සම්බන්ධවී අවසන් කිරීමට පියවර ගන්නා මෙන් කාරුණිකව දැනුම් දෙමි.

2.1 අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු සතු ඉඩම් හා ගොඩනැගිලි හැර අනෙකුත් ස්ථාවර වත්කම් තම ආයතන මට්ටමින් ස්වාධීන තක්සේරු මණ්ඩල පිහිටුවා තක්සේරු කිරීමේ කාර්යයන් සිදුකල යුතුය. ඒ අනුව වත්කමේ පිරිවැය හඳුනාගත හැකි අවස්ථාවල එම වත්කමේ පිරිවැය හෝ පිරිවැය හඳුනාගත නොහැකි අවස්ථාවල තක්සේරු වටිනාකම ගිණුම්වල ඇතුලත් කිරීමට පියවර ගත යුතුය.

2.2 දැනට විසර්ජන ගිණුම පිළියෙල කිරීමේදී එහි සටහන් අංක (i) “ ජංගම නොවන වත්කම් සංචලන පිළිබඳ වාර්තාව ” හි ඇතුලත් කරනුයේ වැය විෂය අංක 2101, 2102 හා 2103 ට අදාල වාහන, ගෘහභාණ්ඩ සහ කාර්යාල උපකරණ හා යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ පිළිබඳ තොරතුරු පමණි. නමුත් 2013 වර්ෂයේ විසර්ජන ගිණුම පිළියෙල කිරීමේදී වැය විෂය අංක 2104 ගොඩනැගිලි හා ඉදිකිරීම්, වැය විෂයය අංක 2105 ඉඩම් සහ ඉඩම් වැඩිදියුණු කිරීම් පිළිබඳ විස්තර ද ඇතුලත් කළ යුතුය. ඊට අමතරව 2013 වර්ෂයේ විසර්ජන ගිණුම පිළියෙල කිරීමේදී ඉහත තොරතුරු සමඟ වර්ෂය තුලදී ජංගම නොවන වත්කම් එකතුකිරීම් වශයෙන් දක්වන වටිනාකම මුදලින් මිලදී ගැනීම් හා වෙනත් ආයතන විසින් පවරන ලද වටිනාකම වශයෙන් වෙනම දැක්විය යුතුය. මීට අදාල සංශෝධිත විසර්ජන ගිණුමේ සටහන් අංක (i) හි ආකෘතියක් මේ සමඟ ඇමුණුම් 1 ලෙස ඉදිරිපත් කෙරේ.

2.3 ස්ථාවර වත්කම් ගිණුම් තැබීමේදී සියලු අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ඒකීය ක්‍රමයක් පවත්වාගත යුතු වීමත් එම වත්කම් පරිගණකගත ක්‍රමයක් මඟින් වාර්තා කිරීම සඳහාත් වත්කම් තොරතුරු විශ්ලේෂණය පහසු කිරීම සඳහාත් 2001 රාජ්‍ය මූල්‍ය සංඛ්‍යා අත් පොතේ (GFS Manual 2001) ඇතුලත් වත්කම් කේත සමඟ ක්‍රියාත්මක කල හැකි කේත ක්‍රමයක් හඳුන්වා දෙනු ලබන අතර එම විස්තරය ඇමුණුම් ii යටතේ ඇතුලත්කර ඇත. ඒ අනුව ආයතනය සතු ස්ථාවර හා ජංගම වත්කම් එම කේත අංක අනුව වර්ගීකරණය කර වත්කම් ලේඛණයට ඇතුලත් කළ යුතුය. මීට අදාල වත්කම් ගිණුම් තැබීම පරිගණකගත ඒකාබද්ධ රජයේ ගිණුම්කරණ වැඩසටහනට (CIGAS) අවශ්‍ය සංශෝධන ඇතුලත්කර ඇති බැවින් එම වැඩසටහන ඉදිරියේදී ඔබ ආයතනයේ ක්‍රියාත්මක කිරීම මඟින් පහසුවෙන් අදාල ගිණුම් තැබීමේ කටයුතු ක්‍රියාත්මක කළ හැකි වේ.

2.4 මෙම කේත ක්‍රමය පහත පරිදි ප්‍රධාන වශයෙන් කොටස් 7 කින් සමන්විතය. එනම්,

| ස්ථාවර | | | | | විචල්‍ය | |
|---|---|---|---|---|---|---|
| **1** | **2** | **3** | **4** | **5** | **6** | **7** |
| 240 | 611 | 6111 | 61111 | 6111101 | | |

1 - අමාත්‍යාංශ / දෙපාර්තමේන්තු ශීර්ෂ අංකය

2 - ප්‍රධාන වත්කම් වර්ගය    එනම්,

I. ස්ථාවර වත්කම් (611)
II. තොගය (612)
III. මැණික්, රත්‍රං වැනි වටිනාකම් සහිත වත්කම් (613)
IV. නැවත නැවත ජනනය නොවන වත්කම් (614)

3 - ප්‍රධාන වත්කම් වර්ගය යටතේ ඇති උප ප්‍රධාන වත්කම්
උදා: ස්ථාවර වත්කම් යටතේ ඇති ගොඩනැගිලි හා සවිකිරීම් (6111)

4 - උප ප්‍රධාන වත්කම් ගණයේ ඇතුලත් වත්කම්
උදා: වාසස්ථාන ලෙස භාවිතයට ගනුලබන නිවාස (61111)

5 - ඉහත 4 හි ඇතුලත් වන අනෙකුත් උප වත්කම් වර්ග
උදා: බෝට්ටු නිවාස (6111101), හෝටල් හා ආපනශාලා (6111106)

ඒ අනුව ඉහත සඳහන් අංක 1 සිට 5 දක්වා වූ කේත ස්ථාවර වන අතර අංක 6 සහ අංක 7 එක් එක් ආයතනයේ අවශ්‍යතාවය පරිදි එම ආයතනයේ වත්කම් තොරතුරු ලබාගැනීම පහසු ආකාරයට අවශ්‍ය කේත අංක සඳහා හඳුන්වාදී ඇත. වත්කම්වල ස්ථාවර තොරතුරු අනුව මහ භාණ්ඩාගාරය විසින් වත්කම් පිළිබඳ මධ්‍යගත තොතුරු එක්රැස් කිරීම සහ වර්ෂ අවසාන ජනරජ ගිණුම සඳහා අවශ්‍ය වත්කම් තොරතුරු සඳහා උපයෝගී කරගනු ලැබේ.

2.5 මෙම නව කේත අංක ක්‍රමයට අනුව අයවැය ඇස්තමේන්තු වල ඇතුලත් වාහන (2101) සඳහා කේත අංක (61121) ද ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ (2102) සහ යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ (2103) සඳහා කේත අංක (61122) ද ගොඩනැගිලි සහ ඉදිකිරීම් (2104) සඳහා කේත අංක (61112) ද ඉඩම් හා ඉඩම් වැඩි දියුණු කිරීම් (2105) සඳහා කේත අංක (614) ද වශයෙන් වූ නව කේත අංක හඳුන්වාදී ඇත.

3. මෙම චක්‍රලේඛ ලිපිය මඟින් ස්ථාවර වත්කම් සඳහා වන නව සංකේත ක්‍රමය හඳුන්වා දීමත් ඒ අනුව තක්සේරු දෙපාර්තමේන්තුව විසින් තක්සේරු කරනු ලබන ගොඩනැගිලි සහ ඉඩම් සඳහා එම සංකේත අංක යෙදීමත් නව පරිගණකගත ඒකාබද්ධ රජයේ ගිණුම්කරණ වැඩසටහනට (CIGAS) යටතේ වත්කම් කළමනාකරණ මෘදුකාංගය හඳුන්වාදීමත් සිදුකර ඇත. එබැවින් මේ සම්බන්ධ වන පැහැදිලි කිරීම්, යෝජනා arunak@treasury.gov.lk දරණ විද්‍යුත් තැපැල මඟින් හෝ 011-2484753 දරණ දුරකථන අංක මඟින් අධ්‍යක්ෂ ගිණුම් සේවා වෙත දන්වන මෙන් කාරුණිකව ඉල්ලමි.

මෙයට-විශ්වාසී,

එන්.ජී.දයාරත්න
අධ්‍යක්ෂ ජනරාල්
රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව

පිටපත්:

1. විගණකාධිපති
2. අධ්‍යක්ෂ ජනරාල් - රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව